ඒකාබද්ධ සේවා චක්‍රලේඛ: 04/2015
මගේ අංකය: PA/CS/**6/4/**කා.ක.වි **-** III
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2015.11.19

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය.</u>

2007.12.10 දින සිට 2011.04.11 දින දක්වා බඳවා ගන්නා ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියේ නිලධාරීන් හට කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත පරිදි නොපැවැත්වීම මත එම විභාග සමත් වීම සඳහා සහන කාලයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදී ඇත.

02. 2010.09.01 (නැගෙනහිර නවෝදය - උතුරු වසන්තය යටතේ බඳවා ගත් නිලධාරීන්), 2011.05.02, 2011.07.01, 2011.09.15 සහ 2012.03.01 වන දිනැතිව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට පත්වීම් ලද සියළුම නිලධාරීන් සඳහා ද එම පන්තියට නියමිත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා ඔවුන්ගේ පත්වීම් දින සිට පවත්වනු ලබන අනුගාමී විභාග වාර 04 ක සහන කාලයක් පහත පරිදි ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

| පත්වීම් දිනය | සහනය ලබා දීමට සළකා බලනු ලබන විභාග පැවැත්වූ දිනයන් | පත්වීම් දිනය | සහනය ලබා දීමට සළකා බලනු ලබන විභාග පැවැත්වූ දිනයන් |
|---|---|---|---|
| 2010.09.01<br>2011.05.02<br>2011.07.01 | 2011.10.01 | 2011.09.15<br>2012.03.01 | 2013.01.27 |
| | 2013.01.27 | | 2014.06.29 |
| | 2014.06.29 | | 2015.09.19 |
| | 2015.09.19 | | ................. |

03. මේ අනුව උක්ත දිනයන්හිදී පත්වීම් ලත් නිලධාරීන් අදාළ විභාග වාර 04 ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කරන්නේ නම් වැටුප් වර්ධක විලම්භනය නොවන අතර සෙසු නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කරන දිනය දක්වා පරිවාස කාලය දීර්ඝ වේ.

04. ඉහත 03 ඡේදයෙහි සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව මේ වන විට වැටුප් වර්ධක විලම්භනය කර ඇති නිලධාරීන්ගේ පරිවාස කාලය සංශෝධනය කිරීම සඳහා ආයතන ප්‍රධානියා මගින් ඉල්ලීම් කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

කේ.වී.පී.එම්.ජේ.ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.